# 6. මිල සහ වැටුප්

## 6.1 මිල

1996 දී සාමාන්‍ය මිල මට්ටම ඉතා තියුණු ලෙස වැඩි විය. ශ්‍රී ලංකාවේ උද්ධමනය අධීක්ෂණය කිරීම සඳහා භාවිතා කරන නිල මිල දර්ශකය වන කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය (කො.පා.මි.ද) 1996 දී වාර්ෂික සාමාන්‍ය පදනමක් මත සියයට 15.9 කින් වැඩි වූ අතර, 1995 දී මෙම වැඩිවීම සියයට 7.7 ක් විය. කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයට වඩා වැඩි ක්ෂේත්‍ර ආවරණයක් සහිත මහ කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය (ම.කො.පා.මි.ද.) 1996 දී සියයට 14.7 කින් වැඩි විය. 1995 දී එහි අනුරූප වැඩිවීම සියයට 3.9 කි. වෙළඳපොලේ මූලික මට්ටමේ මිල වෙනස්වීම් මනිනු ලබන තොග අලෙවි මිල දර්ශකය (තො.අ.මි.ද), වර්ෂය තුළ සියයට 20.5 කින් වැඩි විය. පාරිභෝගික මිල දර්ශකවලට වඩා තොග අලෙවි මිල දර්ශකයේ කැපී පෙනෙන වැඩි වීමට ප්‍රධාන වශයෙන් දායක වූයේ අපනයන මිල ගණන් වැඩිවීමයි. රටේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය වඩාත් පුළුල්ව ආවරණය වන දළ ජාතික නිෂ්පාදිතයේ අවධමනකය (ද.ජා.නි.අ.) 1996 දී සියයට 12.3 කින් වැඩි වූ අතර, පෙර වසරේ මෙම වැඩිවීම සියයට 8.3 ක් විය.

**6.1 සංඛ්‍යා සටහන**

**වාර්ෂික සාමාන්‍ය මිල වෙනස්වීම (%)**

| වර්ෂය | කො.පා.මි.ද | මකො.පා.මි.ද | තො.අ.මි.ද | ද.ජා.නි.ග.මි.ද |
|---|---|---|---|---|
| 1980 | 26.1 | - | 33.7 | 18.2 |
| 1981 | 18.0 | - | 17.0 | 20.6 |
| 1982 | 10.8 | - | 5.5 | 10.2 |
| 1983 | 14.0 | - | 25.0 | 14.7 |
| 1984 | 16.6 | - | 25.6 | 17.4 |
| 1985 | 1.5 | - | -15.2 | 0.8 |
| 1986 | 8.0 | - | -2.9 | 5.5 |
| 1987 | 7.7 | - | 13.4 | 6.8 |
| 1988 | 14.0 | - | 17.8 | 11.5 |
| 1989 | 11.6 | - | 9.0 | 9.7 |
| 1990 | 21.5 | 24.6 | 22.2 | 20.0 |
| 1991 | 12.2 | 11.5 | 9.2 | 11.2 |
| 1992 | 11.4 | 9.4 | 8.8 | 10.0 |
| 1993 | 11.7 | 8.4 | 7.6 | 9.5 |
| 1994 | 8.4 | 4.8 | 5.0 | 9.4 |
| 1995 | 7.7 | 3.9 | 8.8 | 8.3 |
| 1996 | 15.9 | 14.7 | 20.5 | 12.3 |

මූලයන් : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

1996 දී මිල ඉහළ යාමට හේතු වූයේ නියගය නිසා විශේෂයෙන් වී සහ පොල් වැනි දේශීය ආහාර ද්‍රව්‍යවල තාවකාලිකව හිඟයන් පැවතීමත්, තිරිඟු පිටි, භූමිතෙල් ඇතුළු ඉන්ධන, විදුලි ගාස්තු සහ බස් ගාස්තු ආදී පරිපාලන මිල ගණන් ඉහළ යන පරිදි සංශෝධනයන් කිරීමත්, ආනයන මිල ඉහළ යාමත්, ඉහල බලශක්ති පිරිවැය සහ සමහර අංශවල වැටුප් වැඩිවීම නිසා නිෂ්පාදන පිරිවැය ඉහළ යාමත්ය. මේවා අතරින්, වැඩිම බලපෑමක් ඇති වූයේ කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය වැඩිවීමට සියයට 80 කට වැඩි දායකත්වයක් ලබා දුන් ආහාර මිල ඉහළ යාමයි. ආහාර මිල මත නියගයේ බලපෑමට අමතරව, තිරිඟුවල සාමාන්‍ය ජාත්‍යන්තර මිල සියයට 20 න් ඉහළ යාම නිසා තිරිඟු පිටි සහනාධාරය වෙනුවෙන් ඉහළ යන පිරිවැය අඩු කිරීම සඳහා තිරිඟු පිටි වල දේශීය මිල වැඩි කිරීමටද රජය පෙළඹවිය. මත්පැන් සහ දුම්කොළ මත පනවන සුරාබදු වැඩි කිරීම මගින් ද මිල ඉහළ යාම කෙරෙහි සුළු බලපෑමක් ඇති විය. මේවා සහ අනිකුත් පරිපාලන මිල ගණන් වැඩිවීම මගින් 1996 දී පාරිභෝගික මිල ප්‍රතිශතක 2 කින් වැඩි විය.

පරිපාලන මිල සංශෝධනයන් නොකෙරුණි නම්, මිල ගණන්වල හදිසි ඉහළයාම ඉතා අඩු විය හැකිව තිබුණි. කෙසේ වුවද, මේ තත්ත්වය යටතේ පිටි සහනාධාරයේ අතිරේක පිරිවැය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට රජයට ප්‍රසාරණාත්මක මූල්‍යන ක්‍රමවලට යොමු වන්නට ඉඩ තිබුණි. එසේ වුනි නම්, ආර්ථිකය මත තව දුරටත් උද්ධමනකාරී පීඩනය ගොඩ නැගී එය දීර්ඝ කාලයක් තිස්සේ පැවතීමට ඉඩ තිබුණි.


මේ අතරේ පාරිභෝගික සහන වශයෙන් සීනි, සහල් සහ ආහාර සකස් කිරීමට ගන්නා තෙල් වර්ග යනාදියට තීරුබදු සහන සැලසීම සහ අර්තාපල්, ළූණු සහ වියළි මිරිස් සඳහා ආනයන බලපත්‍ර ඉවත් කිරීමත් නිසා මෙම ආහාර ද්‍රව්‍ය වල සැපයුම සුලබ වී නියග නිසා හට ගත් උද්ධමනකාරී බලපෑම අවම කිරීමට හේතු විය. මීට අමතරව වර්ෂයේ දෙවන භාගයේදී මූල්‍ය ප්‍රසාරණ වේගය සීඝ්‍රයෙන් පහත වැටීම මිල මත ඉල්ලුම් පීඩනය අඩු කිරීමට හේතු විය. වර්ෂයේ ප්‍රථම කාර්තු තුනේදී වැඩි වෙමින් තිබුන මිල මට්ටම සැප්තැම්බර් මාසයේ දී උච්ච අවස්ථාවට පත් වී අවසාන කාර්තුවේ දී සීඝ්‍රයෙන් පහත වැටුනි. මෙම පහත වැටීම සියළුම දර්ශක වලින් පෙන්නුම් කෙරුණි. 1995 සැප්තැම්බර්වලට වඩා 1996 සැප්තැම්බර් වලදී සියයට 21.5 ක වැඩිවීමක් පෙන්වූ කො.පා.මි.දර්ශකය 1996 දෙසැම්බර් මාසයේදී සියයට 16.8 දක්වා පහත වැටුණි. පරිපාලන මිල ඉවත් කළ විට, පාරිභෝගික මිල උද්ධමන වේගය අඩුවීම, වඩාත් හොඳින් පෙන්නුම් වේ. මෙම පරිපාලන මිල වැඩිවීම් ඉවත් කොට කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය ගැලපූ පසු උද්ධමන වේගය 1996 සැප්තැම්බර් මාසයේ සියයට 17. 2 සිට 1996 දෙසැම්බර් මාසය වන විට 12. 2 දක්වා පහත වැටී ඇත.

### කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය

පාරිභෝගික මිල දර්ශකයෙහි 1995 මැද භාගයේ සිට ඇරඹුනු ඉහළ යෑමේ උපනතිය 1996 වර්ෂය මුළුල්ලේම පැවැතීමට ආහාර මිල ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු විය. 1996 වර්ෂයේ දර්ශකයේ සමස්ත වැඩිවීමෙන් සියයට 83 කටම දායක වූයේ ආහාර මිල ඉහළ නැගීමයි. 1995 දී සියයට 6.9 කින් ඉහළ ගිය ආහාර උප දර්ශකය 1996 දී සියයට 19.2 කින් වැඩි විය. ප්‍රධාන ධාන්‍ය වර්ග සහ ධාන්‍ය වර්ග මත පදනම් වූ සහල්, තිරිඟු පිටි සහ පාන් වැනි භාණ්ඩවල මිල ගණන් අධික ලෙස වැඩිවීම ආහාර ද්‍රව්‍යවල මිල ඉහළ යාමට විශාල වශයෙන් දායක විය. 1994 අගෝස්තු මාසයේ දී පිළිවෙලින් කිලෝ ග්‍රෑමයක මිල රු. 11.80 සිට රුපියල් 7.45 දක්වාත්, ගෙඩියක මිල රුපියල් 5.00 සිට රුපියල් 3.50 දක්වා පහත හෙලන ලද පිටි සහ පාන් මිල, 1995 දෙවන භාගයේදී අවස්ථා දෙකකදීත් නැවත 1996 අප්‍රේල්, ජූලි සහ අගෝසතු මාස වලදීත් ක්‍රමයෙන් වැඩිවන පරිදි සංශෝධනය කෙරුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 1996 අගෝස්තු අගදී පිටි කිලෝවක් රු. 16.95 ක්ද, පාන් ගෙඩියක්

රුපියල් 6.95 ක්ද විය. මෙලෙස, 1996 දී පාන් වල සාමාන්‍ය මිල වැඩිවීම සියයට 58 ක් පමණ විය. 1996 දී වී නිෂ්පාදනය සියයට 27 කින් අඩුවීමත්, තිරිඟු පිටි මිල වැඩිවීමත් නිසා දක්නට ලැබුන ආදේශන බලපෑම, සහල් මිල සියයට 20 කට වඩා ඉහළ නැංවීමට සමත් විය. ප්‍රධාන ධාන්‍ය වර්ග සහ එම නිෂ්පාදිතයන්ගේ (සහල්, තිරිඟු පිටි සහ පාන්) මිල අධික ලෙස ඉහළ යාම මිල වැඩිවීමේ සමස්ත අගයෙන් සියයට 36 කට වඩා දායක වූ අතර, එමගින් සමස්ත මිල දර්ශකයේ මුළු ඉහළ යාම සියයට 30 ක් විය.

රූප සටහන 6.1
කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය
(1952 = 100)




1996 දී රෙදිපිළි, ඉන්ධන හා ආලෝකය යන කාණ්ඩවල තනි අංකයක මිල වැඩිවීමේ වේගයන් පෙන්නුම් කෙරුණි. පෙර වසරේ සියයට 1.0 කින් වැඩි වූ රෙදිපිළි කාණ්ඩය සඳහා වූ උප දර්ශකය 1996 වසරේදී සියයට 2.2 කින් සුළු වශයෙන් වැඩි විය. ඉන්ධන හා ආලෝකය කාණ්ඩයේ මිල ගණන් සියයට 8.1 කින් වැඩි වූ අතර, පෙර වසරේ වැඩිවීම සියයට 6.1 කි. 1996 සැප්තැම්බර් සිට භූමිතෙල් ලීටරයක මිල රු. 9.50 සිට රු. 10.40 දක්වා ඉහළ යාමත්, වර්ෂය තුළ දර මිල සියයට 7 කින් පමණ වැඩිවීමත්, මෙම කාණ්ඩයේ මිළ ගණන් වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. 1996 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි විදුලිබල ගාස්තු ද සංශෝධනය කෙරිණි. සමස්ත මිල මට්ටම ඉහළ යාමට ඉන්ධන හා ආලෝකය කාණ්ඩයේ මිල ගණන්වල දායකත්වය සියයට 4 ක් වූ අතර, රෙදිපිළි කාණ්ඩයේ දායකත්වය සියයට 1 කට වඩා අඩු විය.

පෙර වසරේ පෙන්නුම් කළ සියයට 14.1 ක වැඩිවීමට සාපේක්ෂව 1996 දී විවිධ ද්‍රව්‍ය සඳහා උපදර්ශකය සියයට 10.8 කින් ඉහළ නැගුණි. මෙම කාණ්ඩයේ මිල ගණන් වැඩිවීමට ප්‍රධාන වශයෙන් දායක වූයේ දුම්කොළ, බුලත් සහ පුවක්, මත්පැන්, පුවත්පත්, ලොන්ඩ්‍රි සේවය යනාදියේ ඉහළ මිල ගණන් සහ වැඩි කරන ලද බස් ගාස්තුයි. සමස්ත දර්ශකය වැඩිවීමට විවිධ කාණ්ඩයේ මිල ගණන්වල බලපෑම සියයට 12 ක් පමණ විය.

**6.2 සංඛ්‍යා සටහන**

**කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (1952 = 100)**

| ශීර්ෂ | භරිත | දර්ශකයේ සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | | 1996 වැඩිවීමේ දයකත්වය |
|---|---|---|---|---|---|---|---|---|
| | | 1995 | 1996 | 1995 | 1996 | දෙසැ. 1995 | දෙසැ. 1996 | (%) |
| සියළුම ශීර්ෂ | 100.0 | 1,644.6 | 1,906.7 | 7.7 | 15.9 | 11.5 | 16.8 | 100 |
| භාණ්ඩ අනුව | | | | | | | | |
| ආහාර | 61.9 | 1,768.1 | 2,107.6 | 6.9 | 19.2 | 11.2 | 20.7 | 83 |
| රෙදිපිළි | 9.4 | 803.9 | 821.8 | 1.0 | 2.2 | 1.4 | 3.4 | 1 |
| ඉන්ධන හා ආලෝකය | 4.3 | 3,322.4 | 3,591.6 | 6.1 | 8.1 | 12.9 | 7.3 | 4 |
| ගෙවල් කුලී | 5.7 | 109.8 | 109.8 | - | - | - | - | - |
| විවිධ | 18.7 | 1,800.6 | 1,994.7 | 14.1 | 10.8 | 15.6 | 9.3 | 12 |

මූලයන් : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

පොල් නිෂ්පාදනය සියයට 7 කින් පහත වැටීම හේතුකොටගෙන පොල් හා පොල් තෙල් මිල සියයට 50 කට වඩා ඉහළ නැගිණි. මිරිස් සහ රතු ළූණු වල කැපී පෙනෙන මිල වැඩි වීම් දක්නට ලැබිණි. මීට ප්‍රතිවිරුද්ධ ලෙස, අර්තාපල් මිල පහත වැටුනි. මෙයට ආනයනයන් සහ දේශීය නිෂ්පාදනය වැඩිවීම නිසා සැපයුම් තත්ත්වය යහපත් වීම හේතුවිය. වී වගාවට ප්‍රමාණවත් ජලය නොමැති වීමෙන් එළවළු වගාව සඳහා විශාල ලෙස කුඹුරු යොදා ගැනීම නිසා බොහෝ වර්ගවල එළවළු මිල වැඩිවීම මධ්‍යස්ථ විය.


සාමාන්‍යයෙන් කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයේ මාසික වෙනස්වීම් වලින් පෙන්නුම් කරන කාලීන මිල හැසිරීම් රටාව, 1995 වර්ෂයේ තරම් 1996 වර්ෂයේදී දක්නට නොලැබුණි. මහ අස්වැන්නක් සමග 1995 පෙබරවාරි සහ මාර්තු මාසවලදී දර්ශකය පහත වැටුනත්, මෙම රටාව 1996 දී පෙන්නුම් නොකළේ අස්වැන්න අයහපත් වීම හේතුවෙනි. ජූලි මාසයේ හැර අන් සියළුම මාස වලදී දර්ශකයේ අගය වැඩි විය.

විශේෂ සටහන 6

## පාරිභෝගික මිල ගණන්හි වාරිකත්වය

බොහෝමයක් සාර්ව ආර්ථික විචල්‍යයන් ක්‍රමික කාල පදනමක් මත යම් ආකාරයක චක්‍රීය හැසිරීමක් ප්‍රදර්ශණය කරනු ලබයි. මෙය 'වාරිකත්වය' යනුවෙන් හැඳින්වෙයි. යම් ශ්‍රේණියක 'ක්‍රමික' බව පිළිබඳව තොරතුරු ලබා දීම හා පූර්ව කථනයන් කිරීමේ දී පමණක් නොව යෝග්‍ය ආර්ථික ප්‍රතිපත්තින් අනුගමනය කිරීමේ දී ද වැදගත් මෙහෙයක් කරනු ලබන යම් ශ්‍රේණියන් ක්‍රමික බව පිළිබඳව තොරතුරු ලබාදෙන බැවින් වාරිකත්ය හඳුනාගැනීම වැදගත් වෙයි. යම් ශ්‍රේණියක වාරිකත්වය හඳුනාගැනීමේ උපක්‍රම කිපයක් ඇත. ඉතාමත් පහසු ක්‍රමය නම් වාරිකත්ව දර්ශකයන් සැකසීම හා කාලයත් සමග එම ශ්‍රේණියේ විචලනයන් විමර්ශණය කිරීමත් ය. සහසම්බන්ධතා ශ්‍රිතයන් ආධාරයෙන් ද වාරිකත්ය හඳුනාගත හැකිය.

වෙළඳ පොල අපූර්ණතාවයන් හේතුකොට ගෙන නිරන්තර අධි සැපයුම් හා ඉල්ලුම් තත්ත්වයන් පෙන්නුම් කරන විශේෂයෙන්ම ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටවල පොදු මිළ මට්ටම ඉහළ වාරිකත්වයන් ඇති සාර්ව ආර්ථික විචල්‍යයකි. පාරිභෝගික ආහාර පැසෙහි වැඩි බරක් ඇති සමහර භාණ්ඩ චක්‍රීය විචල්‍යතාවයන්ට යටත් වන අවස්ථාවන් හිදී මෙය විශේෂයෙන්ම සිදුවන්නකි.




ශ්‍රී ලංකාවේ පොදු මිළ මට්ටමෙන් වාරිකත්වය පරීක්ෂා කිරීම සඳහා වාරිකත්ව නොගැලපු කොළඹ පාරිභෝගික මිළ දර්ශකය(කො.පා.මි.ද) හා වාරිකත්ව ගැලපු කො.පා.මි.ද අතර අනුපාතය ගණනය කිරීමෙන් වාරිකත්ව දර්ශකයන් සකසන ලදී. වාරිකත්ව ගැලපු ශ්‍රේණියෙහි වාරිකත්ව විචලනය ඉවත් කෙරෙනු ලබන අතර, දිගු කාලීන නැම්යාව හා කෙටිකාලීන අක්‍රමික උච්චාවචනයන් නොවෙනස්ව පවතී. පසුගිය වර්ෂ හතර සඳහා එසේ ගණනය කරන ලද වාරිකත්ව දර්ශකය පළමුවෙනි ප්‍රමාණයෙහි දක්වා ඇති අතර එය කාලයත් සමග පූර්ණ ආසන්න තත්ත්වයන් පෙන්නුම් කරයි. මිළ දර්ශකයෙහි වාරිකත්ව විචලනයට පාදක වූ සාධක ඉල්ලුම් හා සැපයුම් යන දෙපාර්ශවයේම බලපෑම් හේතුවෙන් පැන නැගෙන්නකි. පෙබරවාරි - මාර්තු හා ජූලි - සැප්තැම්බර් යන කාලපරිච්ඡේදවල දී උද්ධමනය අඩුවීම සහල් හා එළවළු වල අධි සැපයුමක් ඇති අස්වනු නෙලන ප්‍රධාන කාල පරිච්ඡේද දෙක (පිළිවෙළින් මහ සහ යල) හා සමගාමීව සිදුවේ. අනෙක් අතට, අප්‍රියෙල් - ජූනි හා ඔක්තෝබර් - ජනවාරි යන කාල පරිච්ඡේදයන්හි උද්ධමන වේගය ක්‍රමයෙන් වැඩිවීම ආහාර තොග හිඟවීමක් ඇති අවස්ථාවල දී උත්සව සමයන් දෙකක් (පිළිවෙලින් සිංහල/ හින්දු අළුත් අවුරුද්ද හා නත්තල් /අළුත් අවුරුද්ද) තුළ පාරිභෝගික භාණ්ඩ සඳහා ඉහළ ඉල්ලුමක් තිබීමය.

ශ්‍රී ලංකාවේ පොදු මිල මට්ටමෙහි විචලනයන්හි සම්පූර්ණ වශයෙන් පාහේ පාරිභෝගික ආහාර පැසෙහි සැළකිය යුතු බරක් සඳහා දායක වන සහල් එළවළු මිළ ගණන්වල විචලනයන් මගින් පැහැදිලි කෙරෙන බව ආර්ථික මිතින විශ්ලේෂණයන් පෙන්නුම් කරයි. සහල් මිලෙහි වර්ධන අනුපාතයෙහි සියයට එකක වැඩිවීමත් උද්ධමන වේගය සියයට 0.22 කින් ඉහළ නැංවෙන අතර එලුවළු මිලෙහි වර්ධන අනුපාතයෙහි සියයට එකක වැඩිවීමක් උද්ධමන වේගය සියයට 0.13 කින් ඉහල නැංවෙන බවත් අඩුතම වර්ග ක්‍රමය (OLS) මගින් මිළ සමීකරණයන් ඇස්තමේන්තු කිරීමේ දී පෙන්නුම් කෙරේ.

වෙළඳ ද්‍රව්‍ය වල මිළ ගණන් හා විශාල පරිමාණයේ වාරිකත්ව විචලනයන් අවම කිරීම නිෂ්පාදකයන් හා පාරිභෝගික යන දෙපාර්ශවයේම ප්‍රතිලාභයන්ට හේතු වේ. නිදහස් ආනයනයන් හා බාහිර ලෝකය සමග දේශීය ආර්ථිකයේ වර්ධනය වන්නා වූ ආර්ථික සංකලනය, වැඩි දියුණු වූ ගබඩා පහසුකම් හා අලෙවිකරණ යටිතල පහසුකම් සඳහා ඉඩ ප්‍රස්ථා සලසනු ලබන විවෘත ආර්ථික ප්‍රතිපත්තියකින් මිල මට්ටමේ වාරිකත්ව විචලනයන් අවම කිරීමට හේතු සාධක වේ.

1. 1993 ජනවාරි - 1996 දෙසැම්බර් කාල පරිච්ඡේදය සඳහා වාරිකත්වය ගැලපු මාසික දත්ත සඳහා පළමු පෙළ සහ සම්බන්ධතාව (සස. (1)) සඳහා නිවැරදි කිරීම් සහිත අඩුතම වර්ග ක්‍රමය මගින් පහත සමීකරණයන් ඇස්තමේන්තු කරන ලදී.

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ලඝු ගැලපු මිළ$_{\text{සියළු}}$ | = | නියතය | + | ලඝු ගැලපු මිල$_{\text{සහල්}}$ | + | ලඝු ගැලපු මිල$_{\text{එළවළු}}$ | + | සස. (1) |
| | | 7.43 | | 0.22 | | 0.13 | | 0.98 |
| | | (0.53) | | (4.27) | | (6.88) | | (43.22) |

ආර්$^2$ = 0.99 ඩී, ඩබ්ලිව් = 2.12 එෆ් = 2317

අදල + සංඛ්‍යාතයන් වරහන් තුළ දැක්වේ

ගැලපු මිල$_{\text{සියළු}}$ = සියළු අයිතමයන් සඳහා වාරිකත්වය ගැලපු මිල දර්ශකය

ගැලපු මිල$_{\text{සහල්}}$ = සහල් සඳහා වාරිකත්ව ගැලපු මිල දර්ශකය

ගැලපු මිල$_{\text{එළවළු}}$ = එළවලූ සඳහා වාරිකත්ව ගැලපු මිල දර්ශකය

### 6.3 සංඛ්‍යා සටහන

### මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය (1989, ජනවාරි සිට ජුනි = 100)


| ශීර්ෂ | හරිත | දර්ශකයේ සාමාන්‍යය ප්‍රතිශත වෙනස | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | | 1995 | 1996 | 1995 | 1996 | දෙසැ. 1995 | දෙසැ. 1996 |
| සියළුම ශීර්ෂ | 100.0 | 179.3 | 205.5 | 3.9 | 14.7 | 7.5 | 15.2 |
| භාණ්ඩ අනුව | | | | | | | |
| ආහාර පාන | 69.3 | 183.2 | 216.1 | 2.3 | 17.9 | 6.6 | 18.5 |
| මත්පැන්, දුම්කොළ, බුලත් සහ පුවක් | 3.8 | 228.7 | 250.7 | 17.3 | 9.6 | 20.8 | 11.9 |
| ගෙවල් කුලී | 8.9 | 109.7 | 109.8 | 0.1 | 0.1 | 0.2 | - |
| ඉන්ධන හා එළිය | 5.4 | 200.5 | 215.9 | 8.5 | 7.6 | 13.1 | 5.8 |
| රෙදිපිළි හා පාවහන් | 2.8 | 210.5 | 218.3 | 6.4 | 3.7 | 4.2 | 3.7 |
| සනීපාරක්ෂක සහ සෞඛ්‍ය සේවා, | | | | | | | |
| ගෘහස්ත භාණ්ඩ හා සේවා | 4.9 | 182.7 | 202.8 | 10.5 | 11.0 | 16.5 | 8.6 |
| ප්‍රවාහන හා විදුලි සංදේශ | 2.8 | 167.6 | 181.8 | 2.0 | 8.4 | 2.3 | 16.0 |
| විවිධ | 2.1 | 162.9 | 173.8 | 8.7 | 6.7 | 5.0 | 6.2 |

මූලයන් : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## මහ කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය.

1995 වර්ෂයේ සියයට 3.9 ක වැඩිවීම සමග සැසඳීමේදී මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය 1996 වර්ෂයේ සියයට 14.7 කින් වැඩි විය. සාමාන්‍යයෙන් මහ කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය මගින් වාර්තා කෙරෙන මිල ඉහළ යාමේ වේගය කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයට වඩා අඩු අගයක් පෙන්නුම් කෙරේ. කෙසේ වුවද, 1996 දී, මහ කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයේ ඉහළ යාම පෙර වසරට වඩා බොහෝ දුරට කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයේ ඉහළ යාමට ආසන්න විය. දර්ශක දෙකෙහි බර තැබීම්වල රටාව මෙයට හේතු වේ. දර්ශක දෙක එකිනෙක සැසඳීමේදී ම.කො.පා.මි. දර්ශකයේ ධාන්‍ය සඳහා බර තැබීම අනිකට වඩා වැඩි වන අතර, එළවළු සහ මාළු සඳහා බර තැබීම අඩු අගයන් ගනී. ධාන්‍ය කාණ්ඩයේ, සහල්වලට වැඩි බර තැබීමක් ම.කො.පා.මි. දර්ශකයේ අඩංගු වන අතර, කො.පා.මි. දර්ශකයේ පාන් සහ තිරිඟු පිටි සඳහා වැඩි බර තැබීමක් කර ඇත. 1995 දී, එළවළු සහ මාළුවල මිල තියුණු ලෙස ඉහළ යාම නිසා ම.කො.පා.මි. දර්ශකයේ ඉහළයාමට වඩා (සියයට 3.8) කො.පා.මි. දර්ශකය ඉහළ යාම (සියයට 7.7) වේගවත් විය. 1996 දී, එළවළු මිල මද වශයෙන් වැඩි වූ අතර, ධාන්‍ය මිල ඉහළ යාම ඉතා තියුණු විය. ධාන්‍ය කාණ්ඩයෙහි තිරිඟු පිටි සහ පාන් සඳහා වාර්තා වූ මිල ඉහළයාම (සියයට 50 ට වඩා) සහල් මිල ඉහළ යාමට (සියයට 20 සිට 30) වඩා ඉතා වැඩි විය. මෙම වෙනස්වීම්වල ප්‍රතිඵලයක් වශයෙන් දර්ශක දෙකම ඉහළ ගිය අතර, සාපේක්ෂව වැඩි බර තැබීමක් සහිත පිටි සහ පාන්වල මිල 1996 දී අධික ලෙස වැඩිවීම නිසා කො.පා.මි.ද. වැඩි ඉහළ යාමක් වාර්තා කළේය.

රූප සටහන 6.2
මහ කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකය
(ජන- ජූනි 1989 = 100)




ම.කො.පා.මි. දර්ශකයේ ආහාර උප දර්ශකය 1996 දී සියයට 17.9 කින් ඉහළ ගිය අතර, 1995 දී අනුරූප ඉහළ යාම සියයට 2.3 ක් විය. මෙම වර්ෂයේදී මත්පැන්, දුම්කොළ, බුලත් සහ පුවක්, රෙදිපිළි සහ පාවහන්, ඉන්ධන හා ආලෝකය සහ විවිධ යන කාණ්ඩවල ඉහළයාමේ වේගය අඩු විය. අදාළ උපදර්ශකවල වාර්තාගත ඉහළ යාම පිළිවෙලින් සියයට 9.6, සියයට 3.7, සියයට 7.6 සහ සියයට 6.7 ක් විය. පෙර වසරේ අනුරූප වැඩිවීම පිළිවෙලින් සියයට 17.3, 6.4, 8.5 සහ 8.7 ක් විය. මීට එරෙහිව, සනීපාරක්ෂක සේවා, ගමනාගමන සහ පණිවිඩ හුවමාරු යන කාණ්ඩවල වැඩිවීම පිළිවෙලින් සියයට 11.0 ක් සහ සියයට 8.4 ක් වූ අතර පෙර වසරේ අනුරූප වැඩිවීම පිළිවෙලින් සියයට 10.5 ක් සහ සියයට 2.0 ක් විය.

### 6.4 සංඛ්‍යා සටහන

### තෝරාගත් ආහාර ද්‍රව්‍ය කිහිපයක සිල්ලර මිල ගණන් (මුළු දිවයින)

| අයිතමය | ඒකකය | මිල රුපියල් වලින් | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | | 1994 | 1995 | 1996 | 1995 | 1996 |
| සහල් (තම්බන ලද වර්ගය) | කි.ග්‍රෑ. | 15.85 | 16.11 | 20.80 | 1.6 | 29.1 |
| පාන් (ග්‍රෑම් 450) | ගෙඩියක් | 4.66 | 3.81 | 6.05 | -18.2 | 58.8 |
| බිත්තර | සාමාන්‍ය | 2.95 | 3.28 | 3.40 | 11.2 | 3.7 |
| පොල් (මධ්‍යම) | ගෙඩියක් | 6.04 | 5.45 | 8.82 | -9.8 | 61.8 |
| එළවළු | | | | | | |
| කරවිල | කි.ග්‍රෑ. | 24.91 | 26.70 | 28.16 | 7.2 | 5.5 |
| ගෝවා | කි.ග්‍රෑ. | 21.68 | 24.87 | 23.68 | 14.7 | -4.8 |
| කැරට් | කි.ග්‍රෑ. | 30.93 | 33.60 | 33.59 | 8.6 | -0.1 |
| බෝංචි | කි.ග්‍රෑ. | 28.97 | 30.01 | 29.81 | 3.6 | -0.7 |
| ලීක්ස් | කි.ග්‍රෑ. | 30.49 | 33.44 | 32.09 | 9.7 | -4.0 |
| අර්තාපල් | කි.ග්‍රෑ. | 52.04 | 47.57 | 41.76 | -8.6 | -12.2 |
| රතුළූණු | කි.ග්‍රෑ. | 49.61 | 40.34 | 49.81 | -18.7 | 23.5 |
| වියළි මිරිස් (නො. 1) | කි.ග්‍රෑ. | 110.61 | 122.28 | 139.90 | 10.6 | 14.4 |
| මුහුදු මාළු | | | | | | |
| කෙළවල්ලා | කි.ග්‍රෑ. | 112.25 | 128.69 | 135.03 | 14.6 | 4.9 |
| ගල්මාලු | කි.ග්‍රෑ. | 86.66 | 92.87 | 101.77 | 7.2 | 9.6 |
| හුරුල්ලා | කි.ග්‍රෑ. | 68.97 | 72.63 | 84.91 | 5.3 | 16.9 |
| සාලයා | කි.ග්‍රෑ. | 50.55 | 53.39 | 60.61 | 7.2 | 13.5 |


මූලයන් : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
. ශ්‍රී ලංකා මහ බැංකුව

## තොග අලෙවි මිල දර්ශකය

1995 වර්ෂයේ සියයට 8.8 කින් ඉහළ ගිය තොග අලෙවි මිල දර්ශකය, 1996 දී ඉතා තියුණු ලෙස සියයට 20.5 කින් ඉහළ නැගුණි. කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයට හා මහ කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයට සාපේක්ෂව, සැළකිය යුතු ඉහළ බර තැබීමක් සහිත ප්‍රධාන මූලික අපනයන භාණ්ඩවන තේ සහ පොල්වල මිල සැළකියයුතු ලෙස වර්ධනය වීම අනෙක් මිල දර්ශකවලට වඩා වේගයෙන් තොග අලෙවි මිල දර්ශකය ඉහළ යාමට හේතුවිය. උන්නතාංශ අනුව වර්ග කෙරෙන තේ මිල වැඩිවීමේ වේගය සියයට 36 ත්, 48 ත් අතර පරාසයක පැවතුන අතර, පොල් මිල ඉහළ යෑමේ වේගය සියයට 80 ක් විය. 1996 තො.අ..මි. දර්ශකයේ මුළු ඉහල යෑමෙන් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයකට මෙම ද්‍රව්‍ය වල මිල ඉහළ යාම දායක විය.

තොග අලෙවි මිල දර්ශකයේ සියයට 67.8 ක බර තැබීමක් සහිත ආහාර උපදර්ශකය, 1995 වර්ෂයේ සියයට 5.2 වැඩිවීම් හා සසඳන විට 1996 දී සියයට 30.1 ක වැඩිවීමක් වාර්තා කළේය. මීට අමතරව, අස්වැන්න පහත වැටීම හේතුවෙන් සහ තිරිඟු පිටි සහනාධාරය කපා හැරීමත් සමග සහල්වලට ඇති ඉල්ලුම ඉහළයාම හේතුවෙන් වී මිල තියුණු ලෙස ඉහළ යාම ආහාර කාණ්ඩයේ ඉහළයාමට බලපෑ ප්‍රධාන සාධකයන් විය. 1996, තොග අලෙවි මිල දර්ශකයේ සමස්ත වැඩිවීමෙන් සියයට 84 ක ප්‍රමාණයක් ආහාර මිල නිසා සිදුවී යයි ඇස්තමේන්තු කර ඇත.

රූප සටහන 6.3
තොග මිල දර්ශකය
(1974 =100)




**6.5 සංඛ්‍යා සටහන**
**තොග අලෙවි මිල දර්ශකය**

| ශීර්ෂ | හරිත | දර්ශකයේ සාමාන්‍යය | | වාර්ෂික සාමාන්‍යයෙහි ප්‍රතිශත වෙනස | | ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | | 1995 | 1996 (අ) | 1995 | 1996 (අ) | දෙසැ. 1995 | දෙසැ. 1996 (අ) |
| සියළුම ශීර්ෂ | 100.00 | 950.3 | 1,145.1 | 8.8 | 20.5 | 16.2 | 18.1 |
| භාණ්ඩ අනුව | | | | | | | |
| ආහාර | 67.80 | 800.0 | 1,040.7 | 5.2 | 30.1 | 17.9 | 27.1 |
| මධ්‍යපාන | 2.86 | 1,095.4 | 1,176.0 | 13.0 | 7.4 | 13.0 | 24.3 |
| රෙදිපිළි හා පාවහන් | 4.02 | 580.4 | 626.5 | 20.2 | 7.9 | 27.9 | 2.4 |
| කඩදාසි නිෂ්පාදන | 1.37 | 960.4 | 1,063.4 | 26.1 | 10.7 | 55.7 | -23.5 |
| රසායන හා රසායනික නිෂ්පාදන | 5.16 | 637.0 | 660.9 | 15.7 | 3.8 | 14.2 | 6.3 |
| ඛණිජ තෙල් නිෂ්පාදන | 6.42 | 1,314.8 | 1,374.9 | 1.5 | 4.6 | 8.9 | 15.4 |
| ලෝහ නොවන නිෂ්පාදන | 1.78 | 2,120.4 | 2,238.3 | 11.9 | 5.6 | 8.7 | 3.8 |
| ලෝහ නිෂ්පාදන | 0.93 | 706.4 | 784.4 | 1.2 | 11.0 | 6.7 | 7.0 |
| ප්‍රවාහන උපකරණ | 0.80 | 846.7 | 908.6 | 24.1 | 7.3 | 29.2 | 2.7 |
| විදුලි උපකරණ හා සැපයුම් | 0.96 | 753.0 | 767.7 | 8.8 | 2.0 | 6.6 | 3.3 |
| යන්ත්‍රෝපකරණ | 1.33 | 583.9 | 604.3 | 6.7 | 3.5 | 8.8 | 3.4 |
| ඉන්ධන හා ආලෝකය | 1.79 | 2,131.6 | 2,410.1 | 22.6 | 13.1 | 11.4 | 17.8 |
| විවිධ | 4.78 | 2,481.0 | 2,729.5 | 21.0 | 10.0 | 12.7 | -3.1 |
| ආංශික වර්ගීකරණය 1 | | | | | | | |
| දේශීය ගණය | 50.31 | 890.6 | 994.6 | 6.8 | 11.7 | 5.2 | 12.6 |
| ආනයන ගණය | 27.17 | 773.0 | 862.8 | 10.1 | 11.6 | 24.3 | 9.4 |
| අපනයන ගණය | 22.52 | 1,297.8 | 1,822.3 | 11.0 | 40.4 | 28.7 | 31.1 |
| ආංශික වර්ගීකරණය 11 | | | | | | | |
| පාරිභෝගික භාණ්ඩ | 75.30 | 871.6 | 1,093.1 | 6.4 | 25.4 | 16.0 | 24.0 |
| අන්තර් භාණ්ඩ | 20.52 | 1,187.2 | 1,309.2 | 15.4 | 10.3 | 20.3 | 4.5 |
| ආයෝජන භාණ්ඩ | 4.18 | 1,205.6 | 1,273.1 | 10.1 | 5.6 | 8.1 | 3.7 |

(අ) තාවකාලික

මූලයන් : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

අනෙකුත් උපදර්ශකයන් අතර ලෝහ සහ ඛණිජ තෙල් නිෂ්පාදනයන්හි මිල ගණන් වැඩිවීම පෙර වසරට වඩා වේගවත් වූ අතර, ඉතිරි උපදර්ශකයන් අඩු වේගයකින් වැඩි විය. 1996 සැප්තැම්බර් අග භාගයේ පෙට්‍රෝලියම් නිෂ්පාදනවල මිල ගණන් සියයට 4.6 කින් වැඩි විය. 1995 මෙම වැඩිවීම සියයට 1.5 කි. පසුගිය වර්ෂයේ සියයට 1.2 ක වැඩිවීමට සාපේක්ෂව ලෝහ නිෂ්පාදනවල මිල සියයට 11.0 කින් වැඩි විය. කඩදාසි නිෂ්පාදන, ඉන්ධන හා ආලෝකය සහ විවිධ යන කාණ්ඩවල මිල ගණන් ඉලක්කම් දෙකකින් දැක්වෙන සංඛ්‍යාවලින් එනම්, පිළිවෙලින් සියයට 10.7, සියයට 13.1 හා සියයට 10.0 කින් වැඩි වුවද, මේ වැඩිවීම් 1995 වර්ෂයේ වැඩිවීම් වලට වඩා අඩුවිය.

ආංශික වර්ගීකරණයට අනුව, දේශීය කාණ්ඩයේ මිල ගණන් සියයට 11.7 කින් වැඩි වූ අතර, 1995 වර්ෂයේදී එම වැඩිවීම සියයට 6.8 ක් විය. 1995 දී සියයට 10.1 ක වැඩිවීම හා සසඳන විට, 1996 දී අපනයන කාණ්ඩය සියයට 11.6 කින් වැඩි විය. පෙර වසරේ සියයට 11.0 කින් වැඩි වූ ආනයන කාණ්ඩය ඉතා තියුණු ලෙස සියයට 40.4 කින් වැඩි විය.


අවසාන උපයෝජන වර්ගීකරණයට අනුව, පසුගිය වර්ෂයේ සියයට 6.4 ක වැඩිවීමක් පෙන්වූ පාරිභෝගික කාණ්ඩය සියයට 25.4 කින් ඉහළ නැගිණි. මීට විරුද්ධව, අන්තර් හා ආයෝජන කාණ්ඩයන් පිළිවෙලින් 1995 දී සියයට 15.4 සහ සියයට 10.1 ක වැඩිවීම් හා සසඳන විට 1996 දී එතරම් නොවූ සියයට 10.3 ක සහ සියයට 5.6 ක වැඩිවීම් වාර්තා කරන ලදී.

## ප්‍රාදේශීය මිල වෙනස්වීම

සාධක රාශියක් නිසා ප්‍රදේශයෙන් ප්‍රදේශයට භාණ්ඩ මිල වෙනස් වේ. මේවාට ප්‍රවාහන වියදම, අලෙවි රටා, ප්‍රවාහනයේදී නරක්වීම සහ ප්‍රාදේශීය ඉල්ලුම් රටා තීරණය කෙරෙන රුචිකත්ව වෙනස්කම් යනාදිය ඇතුලත් වේ. මිල වෙනස්කම් වලින් කොටසකට යටිතල පහසුකම් දියුණුවී නොතිබීමද හේතුවේ. ද්‍රව්‍ය කිපයක, කොළඹ, මහනුවර, මාතර, සහ අනුරාධපුරයේ වෙළඳපොලවල 1996 පැවති සාමාන්‍ය සිල්ලර මිල ගණන් සහ කොළඹ වෙළඳපොලෙහි මිල සමග සසඳන විට පැවති විචලනයන් 6.6 වගුවෙන් දැක්වේ. මෙම දත්ත ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල මත පදනම් වේ. මේ දත්ත අනුව, එලවළු වැනි ඉක්මණින් නරක් වන ද්‍රව්‍ය වලට වඩා සහල්, ළූණු, වියළි මිරිස් සහ බිත්තර වැනි ඉක්මණින් නරක් නොවන ද්‍රව්‍යවල ප්‍රාදේශීය මිල වෙනස්වීම අඩු බව නිරීක්ෂණය වේ. අනුරාධපුරය ආසන්නයේ සම්බා සහල් නිෂ්පාදන ප්‍රදේශයක් පැවතීම නිසා සමස්ථ වශයෙන්, කොළඹට වඩා අනුරාධපුරයේ සම්බා සහල් මිල අඩු විය. එළවළු සඳහා කොළඹ ඉහළ මිලක් පැවතුනි. මහනුවර එළවළු මිල අඩු වීමට හේතු වූයේ ඒ ආසන්නයේ බොහෝ ප්‍රදේශවල උඩරට සහ පහත රට එළවළු නිෂ්පාදනය වීමයි. කෙසේවුවද, ළූණු සහ අර්තාපල් මිල අනෙක් වෙළඳපොල වලට වඩා කොළඹ අඩුවීමක් දක්නට ලැබුණි. අවාරයේදී අර්තාපල්, ළූණු වැනි ද්‍රව්‍යයන් ආනයනය කරන අතර එම ආනයනයන් අනෙකුත් වෙළඳපොළවලට ළගාවීම කොළඹ වෙළඳපොල ඔස්සේ සිදුවීම මෙයට හේතුවයි. මිරිස් වගාව බොහෝ දුරට අනුරාධපුරය අවට ප්‍රදේශවල සංකේන්ද්‍රනයවී ඇති නිසා, වියළි මිරිස් සඳහා අනුරාධපුරයේ අඩු මිලක් පැවතුණි. අනෙක් අතට මහනුවර නගරය මුහුදු තීරයෙන් ඉතා ඈත්ව පිහිටි නිසා කොළඹ සහ මාතරට වඩා එහි මුහුදු මාළු මිල අධිකව පැවතුණි. වයඹ සහ බස්නාහිර පළාත්වල බිත්තර නිෂ්පාදනය වැඩි වශයෙන් සංකේන්ද්‍රනය වී ඇති බැවින් කොළඹ බිත්තර මිල අඩුවිය.

රූප සටහන 6.4

● තෝරාගත් භාණ්ඩවල මාසික සාමාන්‍ය මිල - 1996



විශේෂ සටහන 7

## පිටකොටුව ආහාර තොග වෙළඳපොල

පිටකොටුව වෙළඳපොල මෙරට විශාලතම ආහාර තොග වෙළඳපොලයි. කොළඹ නගරය හා තදාසන්න පෙදෙස් සඳහා ප්‍රධාන මධ්‍යම වෙළඳපොලක් ලෙස පමණක් නොව, ආනයනික හා දේශීය නිෂ්පාදිත වෙළඳ ද්‍රව්‍යයන් බෙදාහැරීමේ ප්‍රධාන මධ්‍යස්ථානයක් ලෙස ද එය වැදගත්කමක් උසුලයි. පිටකොටුව වෙළඳ පොළෙහි විකාශයෙහි මූලාරම්භය එම ප්‍රදේශයෙහි ජීවත් වෙමින් වාණිජ කටයුතුවල නියැලී ආසියානු වෙළඳුන් දක්වා ඈතට දිව යයි. කාලයත් සමග මෙම ප්‍රදේශය නොයෙකුත් ආහාර හා ආහාර නොවන වෙළඳ ද්‍රව්‍ය සැපයෙන කුඩා වෙළඳසැල් වලින් පිරී මං මාවත් ජාලයකින් ගෙඩි, තදබදයෙන් යුත් ප්‍රදේශයක් බවට පත්විය. මධ්‍යම තොග වෙළඳ පොළක් සංවර්ධනය වීම සඳහා මූලික අවශ්‍යතාවක් වන පහසු ප්‍රවාහන පහසුකම් තිබීම පිටකොටුව ආහාර වෙළඳපල ස්ථාපිතවීම සඳහා විශාල ලෙස දායක විය. කොළඹ වරාය සමීපව පිහිටා තිබීම ද එහි වර්ධනය තීරණය කිරීමට බලපෑ ප්‍රධාන සාධකයක් විය.

කොළඹ කච්චේරි ගොඩනැගිල්ල අසල පිහිටා තිබූ කොළඹ එළවළු වෙළඳපොල 1981 දී කොළඹ මැනිං ගබඩා සංකීර්ණය වෙත ගෙන යන ලද අතර, එය දැන් රටෙහි සියලුම ප්‍රදේශවල පාගේ එළවළු මිල කෙරෙහි බලපෑම් ඇති කරන්නා වූ ප්‍රධානතම එළවළු හුවමාරු මධ්‍යස්ථානය බවට පත්වී ඇත. මැනිං වෙළඳපොල ආසන්නයෙහි සාන්ත ජෝන් මාළු වෙළඳපොල ද, සහල්, අර්තාපල්, ලූනු, මිරිස් සහ පොල්තෙල් වැනි අනෙකුත් වෙළඳ ද්‍රව්‍ය අලෙවි කරන කුඩා වෙළෙඳ සැල් ද වේ. වර්ධනයත් සමගම වෙළඳ කටයුතු සඳහා මුදල් ණයට දෙන්නන්, බඩු පැටවීම සහ බෑම වැනි මෙහෙයුම් කටයුතු වල නියැලෙන්නන් ආදී නොයෙකුත් විධිමත් නොවන සේවා සපයන්නන් පිටකොටුව ආශ්‍රිතව ස්ථාන ගත වී ඇත.

පිටකොටුව තොග ආහාර වෙළඳපොලෙහි වඩාත්ම කැපී පෙනෙන අංශය ලෙස ගැනෙන මැනිං වෙළඳපොල කොළඹ මහ නගර සභාවෙන් කුලියට ලබා දී ඇති වෙළඳසැල් 1200 කින් පමණ සමන්විත වේ. මින් වෙළඳ සැල් 800 ක පමණ එළවලු වෙළෙඳම සිදු කෙරෙන අතර, ඉතිරියෙහි පළතුරු සහඅනෙකුත් වෙළඳ ද්‍රව්‍යයන් වන කරවල, මස්, පොල්, බිත්තර සහ වෙනත් ආහාර ද්‍රව්‍ය වෙළෙඳම් කෙරේ. එළවළු ද්‍රව්‍ය ප්‍රවාහනය කෙරෙන ලොරි 200 ක් පමණ මැනිං වෙළඳපොල වෙත දිනපතා පැමිණේ. නිෂ්පාදන ප්‍රදේශයන්ගෙන් එළවළු සැපයීම ප්‍රධාන වශයෙන් කෙරෙන්නේ එළවලු එකතු කරන්නන් නැතහොත් එළවලු රැස්කිරීමේ නියෝජිතයින් මගිනි. ඔවුන් රටපුරා ,විසිරී සිටින සුළු පරිමාණ නිෂ්පාදකයින් හා තොග වෙළඳුන් සම්බන්ධ කෙරෙන පුරුකක් ලෙස ක්‍රියාත්මකවේ. සමහර අවස්ථාවල දී නිෂ්පාදිකයින් ද ඔවුන්ගේ නිෂ්පාදිත කෙලින්ම වෙළඳපොල කරා ගෙන එනු ලබයි. කෙසේ නමුත් මෙය දක්නට හැක්කේ ප්‍රවාහන පහසුකම් පහසුවෙන් සපයා ගත හැකි විශාල පරිමාණ නිෂ්පාදකයින් අතරේ පමණි. සුළු පරිමාණ නිෂ්පාදකයින් හා වෙළෙඳුන් අතර හමුවීම කලාතුරකින් සිදු වුවද වෙළෙඳම සිදුවන ස්වරූපය අනුව ඔවුනතර දිගු කාලීන සම්බන්ධතාවයක් ගොඩනැගී ඇත.

මැනිං වෙළෙඳපොලෙහි ගණුදෙනු කෙරෙනුයේ කොමිස් පදනම මත බැවින් වෙළෙන්දට දැරීමට සිදුවන අවදානම ලාභාංශ මත පදනම් වූ වෙළඳමට වඩා අඩුය. නිෂ්පාදකයින් තම නිෂ්පාදිත ඒවායේ ප්‍රමාණය හා යැවිය යුතු වෙළෙඳුන්ගේ නම් සටහන් කරන ලද සටහනක් සමග නිෂ්පාදන එකතු කරන්නන්ගේ මාර්ගයෙන් වෙළෙඳපොල වෙත යවනු ලබයි. මිල තීරණය වෙනුයේ වෙළඳපොලෙහි එදිනෙද පවතින ඉල්ලුම හා සැපයුම් තත්ත්වයන් පාදක කොට ගෙනයි. නගරාසන්න සහ පිට පළාත්වල පිහිටි වෙළෙඳපොල වලින් තොග සහ සිල්ලර ගැණුම්කරුවෝ තම සැපයුම් ලබාගැනීම සඳහා මැනිං වෙළඳපොල වෙත දිනපතා පැමිණෙති. මිල දී ගැනීම සඳහා ඔවුන් මිළ ගණන් ඉදිරිපත් කිරීමේ දී එකිනෙක එළවලු වර්ග වකිණිය හැකි මිල පරාසය පිළිබඳ තමන් සතු මනා දැනුම උපයෝගී කර ගනී. ඉදිරිපත් කෙරෙන මෙම මිල ගණන් සහ සැපයුම් තත්ත්වයන් සැළකිල්ලට ගනු ලබන තොග වෙළෙන්ද එකිනෙක එළවළු වර්ග සඳහා මිල තීරණය කිරීමෙහි යෙදෙයි. මිල තීරණය කිරීමෙන් පසු තොග වෙළෙන්ද ඔහුගේ කොමිස් මුදල (එළවළු සඳහා නම් 10% ක් පමණ) හා අනෙකුත් ප්‍රවාහන හා මෙහෙයුම් (පැටවීමේ සහ බෑමේ) ගාස්තු අඩුකොට ඉතිරිය චෙක්පතකින් හෝ මුදලින් නිෂ්පාදකයා වෙත එකතු කිරීමේ නියෝජිතයා මගින් ලැබෙන්නට සලස්වයි. නිෂ්පාදකයින් සාමාන්‍ය වශයෙන් තම නිෂ්පාදිත විකිණීම සඳහා වෙළෙඳුන් කිහිප දෙනෙක් වෙත යොමු කරනු ලබන හෙයින් මිලෙහි සිදුවන ඕනෑම වෙනස්වීමක් ඔහුට ක්ෂණිකවම දැනගත හැක. මෙම ක්‍රියාදාමය වෙළෙඳ පොලෙහි වෙළඳුන් අතර පැවතෙන මිල වෙනස්වීම අවම කිරීමෙහි උපකාරී වනු ඇත.

ශ්‍රී ලංකාවේ එළවළු වෙළඳපොල සැපයුම් මගින් මෙහෙයවීමේ නැඹුරුවක් දක්නට ඇත. එළවළු පහසුවෙන් විනාශ වී යා හැකිවීම, ගබඩා කිරීමේ පහසුකම් හිඟකම සහ ඒවා සැකසීමේ කර්මාන්ත සීමිත වීම යන කරුණු සැලකීමේ දී මෙය බලාපොරොත්තු විය හැකි තත්ත්වයකි. හිතකර දේශගුණික තත්ත්වයන් පවත්නා කාලවල දී වෙළෙඳ පොලෙහි අතිරික්තයක් පැවතිය හැක. එළවළු සඳහා පවතින ඉල්ලුම බොහෝ දුරට ස්ථාවර හෙයින් (ගබඩා කිරීමේ සහ සැකසීමේ පහසුකම් හී පවතින ඌණතාවයන් සැලකිල්ලට ගැනීමේ දී) මෙහි ප්‍රතිඵලය වන්නේ නිෂ්පාදන වියදම් පියවා ගත නොහැකි මට්ටමක් දක්වා මිල මට්ටම පහත වැටීමයි. මෙබඳු අවස්ථා වල දී වගා කටයුතු සඳහා අවශ්‍ය මූලික මූල්‍ය පහසුකම් මඳ නිසාවෙන් හෝ හුදෙක් අධෛර්‍යමත් වීම නිසාවෙන් හෝ නිෂ්පාදකයින් ඊළඟ කන්නයේ වගා කටයුතු වලින් වැලකී සිටීමට ඉඩ ඇත. මෙය නිෂ්පාදනයේ ඌනතාවයකට ද ඒ හේතුවෙන් ඇතිවන මිල ඉහළ නැගීමකට ද තුඩු දෙනු ඇත. එළවළු මිලෙහි මෙම හැසිරීම සම්භාව්‍ය ආර්ථික මූලධර්මයක් වන මකුළු දැල් න්‍යාය අනුව ක්‍රියාත්මක වන්නක් බඳුය.

මැනිං එළවළු වෙළඳපොලට ඉදිරියෙන් ඇත්තේ අනෙකුත් වෙළඳ ද්‍රව්‍ය ගණුදෙනු කරුවන්ගෙන් පිරී සුප්‍රසිද්ධ පිටකොටුවේ හරස් වීදි සමූහයයි. මෙයින් 4 වන හරස් වීදිය ප්‍රධාන වශයෙන් සහල් වෙළෙඳුන්ගෙන් යුක්ත වන අතර 5 වන හරස් වීදිය ප්‍රධාන වශයෙන් ළූණු, අර්තාපල්, මිරිස් සහ පොල්තෙල් වෙළඳම් කෙරෙන වෙළෙඳ සැල් වලින් සමන්විත වේ. මෙම වෙළඳ සැල් වලින් වැඩි කොටසක් පුද්ගලික අයිතියට නතුව තිබෙන අතර සුළු කොටසක් කොළඹ මහ නගර සභාවට අයත් වේ.

සහල් සැපයුම් දේශීය සහ ආනයනික යන දෙවර්ගයෙන්ම යුක්ත වේ. දේශීය සහල් වර්ග පොළොන්නරුව, අනුරාධපුරය, අම්පාර සහ තිස්සමහාරාමය වැනි ප්‍රදේශවලින් සැපයෙන අතර ආනයනික සහල් ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශයේ ප්‍රධාන ආනයන කරුවන් මගින් සැපයේ. සහල්, ළූණු සහ අර්තාපල් වෙළෙඳම කොමිස් පදනම මත සිදු කෙරෙන අතර, ඉන් සහල් සඳහා අය කෙරෙන කොමිස් ප්‍රමාණය 3% කි. කෙසේ නමුත් පරිප්පු, සීනි සහ පොල්තෙල් වෙළෙඳම ලාභ පදනම් කොටගෙන සිදු කෙරේ.

කොළඹ මධ්‍යම මාළු වෙළෙඳපොල පිහිටා ඇත්තේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් 1983 දී සාන්ත ජෝන් මාළු වෙළඳපොල සඳහා ගොඩනංවන ලද නව ගොඩනැගිල්ල තුළය. එය නාගරික සංවර්ධන අධිකාරියෙන් කුලියට ලබා දී ඇති තොග වෙළෙඳසැල් 87 න් ද සිල්ලර වෙළෙඳ සැල් 105 න් ද සමන්විත වේ. මාලු ඇල්ලීම බහුලව කෙරෙන කාලවල දී නැගෙනහිර, බටහිර සහ දකුණු වෙරළ තීරයන්ගෙන් වෙළෙඳ පොලට සැපයෙන මාළු ප්‍රමාණය දිනකට ලොරි 300 සිට 400 ක් තරම් වැඩි වේ. මෙම වෙළඳ පොලෙහි ද තොග වෙළෙඳම කොමිස් පදනම මත සිදු කෙරෙන අතර එය මාළු වර්ගය අනුව 10% සිට 15% දක්වා වෙනස් වෙයි. මෙම වෙළෙඳ පොලෙහි දක්නට ලැබෙන විශේෂිත ලක්ෂණයක් නම් උසස් මට්ටමක පවතින සංවිධානාත්මක භාවයයි. මෙය වෙසෙසින්ම ශ්‍රමය බෙදී යන ආකාරයෙහි දක්නට ලැබේ. පැටවීමේ සහ බෑමේ කටයුතු සඳහා ද, මාළු කැපීම සහ ඒවා පෙට්ටි වල ඇසිරීම වැනි කටයුතු සඳහා ද වෙන් වෙන් ශ්‍රමික කණ්ඩායමක් ඇත.

තෝරාගත් වෙළඳපොල හතරෙහි මාසික මිල මට්ටම් වෙනස්වීම රූප සටහන් 6.4.1 සිට 6.4.4 මගින් නිරූපනය වේ. මෙම වෙළඳපොල හතරෙහි කාලීන රටාව පුළුල්ව වෙනස් නොවන බව මෙම වගු වලින් හෙළි වේ. අනෙකුත් මධ්‍යස්ථාන සමග සැසඳීමේදී අනුරාධපුරයේ අවුරුද්ද පුරාම, සම්බා සහල් මිල සැලකිය යුතු ලෙස අඩුවිය. අවධානයට ලක් කෙරුණ මධ්‍යස්ථාන සියල්ලෙහිම, ජූනි මාසයේදී එළවළු වර්ග රාශියක්ම මිල උච්චම මට්ටමේ පැවතුණි. අස්වනු නෙලන සමයේ විශාල තොග ලැබීම නිසා මහනුවර වෙළඳපොලෙහි විශේෂයෙන්ම බෝංචි මිල ඉතා පහත් මට්ටමකට වැටුණි. මෙම සංසිද්ධිය මාර්තු මාසයේදී සහ අගෝස්තු සිට ඔක්තෝබර් දක්වා කාලය තුළ දැකගත හැකි විය.

ගබඩාකරණ පහසුකම් අඩුකම සහ වගාකරුවන්ට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොමැතිවීමත් ය. මූල්‍ය අපහසුතා මත තම නිෂ්පාදන බෝග නියමිත කාලයට පෙර නෙලා ගැනීමට වගාකරුවන් පෙළඹේ. කුඩා රටක් වන ශ්‍රී ලංකාවෙහි සාපේක්ෂ වශයෙන් පාරිභෝජන රටාව ඒකාකාර වන අතර ප්‍රාදේශීය ඉල්ලුම් රටාව ද එතරම් වෙනස් නොවේ. භාණ්ඩ හා සේවා මත වූ වක්‍ර බදු රට පුරා ඒකීය වන බැවින් ඒවා මිල වෙනස්වීම කෙරෙහි කිසිදු බලපෑමක් නොකෙරේ.

ප්‍රාදේශීය මිල වෙනස්වීම් ආර්ථික සංවර්ධනයත් සමග අඩුවනු ඇත. උදාහරණයක් වශයෙන්, ප්‍රවාහන පහසුකම් සහ මාර්ග පද්ධතිය

**6.6 සංඛ්‍යා සටහන**

**වෙළෙඳපොළ කිහිපයක තෝරාගත් ආහාර ද්‍රව්‍යය සඳහා පැවැති සිල්ලර මිලෙහි වාර්ෂික සාමාන්‍යයන්**

| භාණ්ඩය | මිල (රු. / කි. ග්‍රෑ.) | | | | කොළඹ සමග ප්‍රතිශත වෙනස | | |
|---|---|---|---|---|---|---|---|
| | කොළඹ | මහනුවර | මාතර | අනුරාධපුරය | මහනුවර | මාතර | අනුරාධපුර |
| සම්බා සහල් | 27.58 | 26.96 | 27.45 | 25.20 | -2.2 | -0.5 | -8.6 |
| කැකුළු සහල් | 23.81 | 22.13 | 20.96 | 22.93 | -7.1 | -12.0 | -3.7 |
| බෝංචි | 35.87 | 27.12 | 28.42 | 29.13 | -24.4 | -20.8 | -18.8 |
| ගෝවා | 26.88 | 18.86 | 22.98 | 23.66 | -29.8 | -14.5 | -12.0 |
| වම්බටු | 31.19 | 17.49 | 17.63 | 17.93 | -43.9 | -43.5 | -42.5 |
| වට්ටක්කා | 18.09 | 13.64 | 16.11 | 15.50 | -24.6 | -10.9 | -14.3 |
| රතුළූණු | 47.08 | 52.12 | 49.44 | 50.73 | 10.7 | 5.0 | 7.8 |
| බොම්බායිළූණු | 26.89 | 29.31 | 25.84 | 29.62 | 9.0 | -3.9 | 10.2 |
| අර්තාපල් | 38.53 | 43.07 | 41.58 | 44.13 | 11.8 | 7.9 | 14.5 |
| වියළි මිරිස් | 135.64 | 139.15 | 136.42 | 120.65 | 2.6 | 0.6 | -11.1 |
| කෙළවල්ලා | 124.27 | 152.58 | 148.96 | 148.04 | 22.8 | 19.9 | 19.1 |
| හුරුල්ලා | 73.24 | 95.35 | 76.33 | 84.58 | 30.2 | 4.2 | 15.5 |
| බිත්තර (1ක මිල රු. ශත) | 3.06 | 3.30 | 3.24 | 3.37 | 7.8 | 5.9 | 10.1 |
| පොල් (1ක මිල රු. ශත) | 11.15 | 9.67 | 9.35 | 9.24 | -13.3 | -16.1 | -17.1 |

මූලය : දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩ පිළිවෙල
සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

දියුණු වෙමින් පවතින රටවල් අතුරින්, සාපේක්ෂ වශයෙන් ඈත ගම්බද ප්‍රදේශවලට පවා ළඟා විය හැකි පැතිරී ගිය මාර්ග පද්ධතියක් සහිත රටකි ශ්‍රී ලංකාව. ආර්ථික නිදහස් කරණයෙන් පසුව, පෞද්ගලික අංශයේ වාහන සංඛ්‍යාව සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ. රට පුරා පැතිරුණ සුළු පරිමාණ වගාකරුවන්ගේ නිෂ්පාදන විවිධ ප්‍රාදේශීය විකුණුම් ස්ථාන කරා ගෙන යාමට පෞද්ගලික අංශයේ ලොරි සහ ට්‍රක් මෙන්ම රාජ්‍ය අංශයේ වාහනද, යොදා ගනු ලැබේ. එහෙත් භාණ්ඩ ප්‍රවාහනයේදී කුණුවීම සහ තත්ත්වය පහත වැටීම ප්‍රාදේශීය මිල වෙනස්වීමට බලපාන වැදගත් සාධකයක් ලෙස දිගටම පවතින අතර එය එළවළු සඳහා විශේෂ වේ. ප්‍රවාහනයේදී එළවළු වලින් තුනෙන් එකක් පමණ විනාශ වන බව නිරීක්ෂණය කර තිබේ. එළවළු අධික ලෙස නරක්වීමට ඉවහල්වන තවත් සාධකයක් නම් දියුණුවීම නිසා ප්‍රවාහන වියදම් සහ ප්‍රවාහනයේදී නරක්වීම නිසා අපතේ යන ප්‍රමාණය පහත හෙළීමට හැකිවේ. තාක්ෂණික දියුණුව සමග බැඳුන සංවර්ධනයෙහි ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදනවල තත්ත්වය වැඩිදියුණු කිරීමටත් වඩා හොඳ ගබඩාකරණ හා ඇසුරුම් ක්‍රමවලට හුරුවීම නිසා ප්‍රවාහනයේදී සිදුවන නරක්වීම සහ බර අඩුවීම ද අවම කළ හැකිය. නිදහස් ආර්ථික වාතාවරණයක් තුළ වෙළෙඳුන් අතර තරගකාරිත්වය වැඩිවීම නිසා භාණ්ඩ ප්‍රවාහන සහ හසුරවීමේ කාර්යක්ෂමතාවයන් වැඩිදියුණු වනු ඇත. මේ හා සමානව, වඩාත් හොඳ සන්නිවේදන පහසුකම් සැලසීමෙන් සහ තොරතුරු ඉක්මණින් පැතිරවීම තුළින් පළාත් අතර මිල වෙනස්කම් අවම කළ හැකි වේ.

## 6.2 වැටුප්

1995 වර්ෂයේ, සියයට 28 කින් වැටුප් වැඩි කරන ලද රාජ්‍ය අංශයේ ගුරුවරුන්ගේ හැරෙන්නට රජයේ සියළුම සේවකයින්ගේ මුල්‍ය වැටුප්වල සාමාන්‍යය 1996 දී ඉහළ නැගුණි. සංවිධානයවූ පෞද්ගලික අංශයෙහි සමස්ත වැටුප් වැඩිවීම් පෙර වසරට වඩා වැඩි වූ අතර, අසංවිධිත පෞද්ගලික අංශයෙහි කාර්යයන් වැඩි ගණනක මුල්‍ය වැටුප්වල සැලකිය යුතු වැඩිවීම් වාර්තා විය. කෙසේ වුවද, 1996 හි උද්ධමන වේගය

### රාජ්‍ය අංශය

1996 ජනවාරි සිට ක්‍රියාත්මක වන පරිදි රු. 100/= ක අතුරු දීමනාව, 1994 වර්ෂයේ අගෝස්තු මාසයේ සිට කිසිම වැටුප් වැඩිවීමක් නොලද රාජ්‍ය අංශයේ සේවා නියුක්ත කාණ්ඩයන් සඳහා ගෙවීමට සහ මෙම දීමනාව ජුලි මාසයේ සිට රු. 250/= දක්වා වැඩි කිරීමට නියමිත විය. කෙසේ

### 6.7 සංඛ්‍යා සටහන

### වැටුප් පරිමාණ දර්ශක අංක (1978 දෙසැම්බර් = 100)

| | මුල්‍ය | | මූර්ත | | 1996 ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 (අ) | 1995 | 1996 (අ) | මුල්‍ය | මූර්ත |
| 1. රජයේ සේවකයන් | | | | | | |
| සියළුම රජයේ සේවකයන් | 792.5 | 818.2 | 115.4 | 103.0 | 3.2 | -10.7 |
| විධායක නොවන | 749.4 | 757.1 | 109.2 | 95.3 | 1.0 | -12.7 |
| සුළු සේවකයන් | 828.1 | 878.7 | 120.6 | 110.8 | 6.1 | -8.1 |
| රජයේ පාසැල් ගුරුවරුන් | 760.5 | 760.5 | 110.8 | 95.7 | 0.0 | -13.6 |
| 2. පඩි පාලක සභාවලට අයත් කම්කරුවන් | | | | | | |
| සියළුම පඩිපාලක සභාවලට අයත් කම්කරුවන් | 740.3 | 801.7 | 107.8 | 100.7 | 8.3 | -6.6 |
| කෘෂිකාර්මාන්තයෙහි නියැලුණු කම්කරුවන් | 830.9 | 907.9 | 121.1 | 113.9 | 9.3 | -5.9 |
| කාර්මාන්ත හා වාණිජ කටයුතු වල නියැලුණු කම්කරුවන් | 651.6 | 682.8 | 94.8 | 85.9 | 4.8 | -9.4 |
| සේවා ආංශයන්හි කම්කරුවන් | 456.7 | 487.2 | 66.5 | 61.3 | 6.7 | -7.8 |

(අ) තාවකාලික

මූලයන් : කම්කරු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

තියුණු ලෙස ඉහළ යාම නිසා, සංවිධිත අංශයේ සහ අසංවිධිත අංශයේ බොහෝ කාර්යයන්හි මූර්ත වැටුප් අයහපත් අතට හැරුණි.

බී. සී. පෙරේරා වැටුප් සමාලෝචන කොමිෂමේ නිර්දේශයන්ට අනුව, රාජ්‍ය අංශයේ වැටුප් ව්‍යුහයන්හි සංශෝධනයන් 1997 සිට ක්‍රියාත්මක වීමට නියමිත වීම නිසා, 1996 වර්ෂයෙහි රාජ්‍ය අංශයේ සේවකයන්ගේ වැටුප් නොවෙනස්ව පැවතුනි. තේ වැවීමේ හා නිපදවීමේ කර්මාන්ත අයත් පඩිපාලක සභාවෙන් ආවරණය කෙරෙන පෞද්ගලික වැවිලි අංශයේ සේවකයන්ගේ වැටුප්වලට සමාන වන සේ වැවිලි අංශයේ රාජ්‍ය වැවිලි අංශයේ සේවක වැටුප් ඉහළ නැංවෙන පරිදි සංශෝධනය කරන ලදී. 1996 වර්ෂයේ තවත් පඩි පාලක සභා තුනක් මගින් ඒවාට අයත් වන කර්මාන්තයන් සඳහා ගෙවිය යුතු වැටුප් සංශෝධනය කෙරුණි. අසංවිධානය වූ අංශයේ පවත්නා දත්ත වලින් පෙන්නුම් කෙරෙන්නේ කාර්යයන් කිහිපයක මුල්‍ය වැටුප් වැඩිවීම, සංවිධානය වූ අංශයේ වාර්තාගත අදාළ වැටුප් වැඩිවීම් වලට වඩා තියුණු බවකි. එසේ වුවත්, 1996 වර්ෂය තුළ උද්ධමනය දෙගුණයකටත් වඩා වැඩිවීමත් සමග බොහෝ කාර්යයන් සඳහා මූර්ත වැටුප් නරක අතට හැරුණි. කෙසේ වුවත්, මූර්ත වැටුප් ගණනය කිරීම සඳහා භාවිතා කරන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ අඩංගු දුර්වලතා නිසා එය භාවිතා කිරීමේදී සැලකිලිමත්වීම වැදගත් වේ. මීට අමතරව, එක් එක්, සේවක කාණ්ඩ සඳහා වූ පරිභෝජන භාණ්ඩ පැස වෙනස්විය හැකි අතර, වෙනත් දර්ශක නොමැති බැවින් මූර්ත වැටුප් ගණනය කිරීම සඳහා එකම පාරිභෝගික මිල දර්ශකයක් භාවිතා කිරීමද සුදුසු නොවිය හැකිය.

වුවද, 1994 අගෝස්තු මාසයේ සිට රාජ්‍ය අංශයේ සියළුම සේවකයන් වාගේ කවර හෝ වැටුප් වැඩිවීමක් ලබා ඇති බැවින් ඔවුන් මෙම දීමනාව සඳහා සුදුසුකම් නොලැබිය. රාජ්‍ය සේවා නියුක්තයින් සඳහා වූ වැටුප් පරිමාණ දර්ශකයෙන් මනිනු ලබන පරිදි සියළු රාජ්‍ය සේවකයන් සඳහා වූ සාමාන්‍ය මුල්‍ය වැටුප් 1995 වැඩිවීම වූ සියයට 7.7 හා සසඳන විට 1996 දී සියයට 3.2 කින් වැඩි විය. වර්ෂය තුළදී මූර්ත වැටුප් සියයට 10.7 කින් පහත වැටීමක් මෙයින් පෙන්නුම් වේ. පෙර වර්ෂයේ, මූර්ත වැටුප් ස්ථාවරව පැවතුනි. විධායක නොවන නිලධාරීන් සඳහා මුල්‍ය වැටුප් පරිමාණ දර්ශකය සියයට 1.0 ක සුළු වැඩි වීමක් පෙන්වූ අතර, 1995 වසරේ එම වැඩිවීම සියයට 8.2 ක් විය. 1995 දී මෙම කාණ්ඩය සඳහා සියයට 0.5 කින් ඉහළ ගිය මූර්ත වැටුප් දර්ශකය 1996 දී සියයට 12.7 කින් පහත වැටුණි. සුළු සේවකයන් සඳහා වූ මුල්‍ය වැටුප් පරිමාණ දර්ශකය වර්ෂය තුළදී සියයට 6.1 කින් ඉහළ ගිය අතර, පසුගිය වසරේ මෙම ඉහළයාම සියයට 7.2 ක් විය. මෙම කාණ්ඩය සඳහා මූර්ත වැටුප් දර්ශකය 1995 වසරේ සියයට 0.4 කින් පහත වැටුන අතර, 1996 දී එය තවදුරටත් සියයට 8.1 කින් පහළ වැටුනි. 1995 වර්ෂයේ තියුණු ලෙස සියයට 27.5 කින් ඉහළ ගොස් තිබුන රජයේ ගුරුවරුන් සඳහා මුල්‍ය වැටුප් දර්ශකය, 1996 දී නොවෙනස්ව පැවතුනි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පසුගිය වසරේදී සියයට 18.6 කින් සැලකියයුතු ලෙස ඉහළ ගිය මූර්ත වැටුප් 1996 දී සියයට 13.6 කින් පහත වැටුණි.

## පෞද්ගලික අංශය

1993 සිට දිනකට රු. 72.24 ක ඒකාබද්ධ මට්ටමක පිහිටවනු ලැබූ ජනතා වතු සංවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රාජ්‍ය වතු සංස්ථාව යටතේ එන තේ වගාවෙහි නියුතු සේවකයන්ට දිනක වැටුප, තේ වැවීමේ හා නිපදවීමේ කර්මාන්තයට අදාල පඩි පාලක සභාවල විචල්‍ය ජීවනාධාර දීමනාව ලබන සේවකයන්ට ගෙවන අවම වැටුපට සමාන වන සේ මැයි මාසයේ සිට ඉහළ දමන ලදී. මෙම කර්මාන්තයට අයත් රාජ්‍ය වැවිලි අංශයේ වැටුප් 1996 අගෝස්තු තෙක් ගෙවීමට තේ වැවීම හා නිපදවීමේ කර්මාන්තය සඳහා පඩි පාලක සභාව මගින් තීරණය වූ මට්ටමේ පැවතුණ අතර, ඉන්පසුව එය දිනකට රු. 83.00 ක මට්ටමක ඒකාබද්ධ කොට තබන ලදී. තේ වැවීමේ හා නිපදවීමේ කර්මාන්තයට අයත් පඩිපාලක සභාවන්ට අයත් වැටුප් ද, අගෝස්තු මාසයේ සිට රු. 83.00 ක ඒකාබද්ධ මට්ටමක තබන ලදී. එමෙන්ම, පෞද්ගලික අංශයේ තේ වතුවල සේවකයින් සඳහා ද ජීවනාධාර දීමනාව නතර කරන ලදී. ගිනි පෙට්ටි නිපදවීමේ කර්මාන්තය, වී කෙටීමේ කර්මාන්තය සහ පුවත්පත් කලාවේදීන්ගේ වෘත්තියට අයත් සේවකයින් ආවරණය කෙරෙන තවත් පඩිපාලක සභා තුනක අවම වැටුප් ද 1996 වර්ෂයේදී සංශෝධනය කරන ලදී. මෙම වෙනස්වීම් ක්‍රියාකාරී පඩිපාලක සභා 34 න් 28 ක්, 1995 වර්ෂයේ වැටුප් සංශෝධනයන්ට අනතුරුව සිදුවුණි.

ඉහත සංශෝධනයන් සමග, සියළු පඩි පාලක සභාවන්ගෙන් ආවරණය වන අවම වැටුප් පරිමාණ දර්ශකය මගින් මනිනු ලබන සංවිධිත පෞද්ගලික අංශයේ සේවකයින්ගේ සමස්ත නාමික වැටුප් 1996 දී සියයට 8.3 කින් වැඩි වූ අතර, එය 1995 දී වාර්තාගත සියයට 3.9 ක වැඩිවීමට වඩා ඉහළ වැඩිවීමකි. කෙසේ වුවද, පසුගිය වසරේ පෙන්වූ සියයට 3.6 ක පහත වැටීම අනුව යමින් මූර්ත වැටුප් තවදුරටත් සියයට 6.6 කින් පහත වැටුණි. වැවිලි කර්මාන්තයේ සේවක වැටුප් වැඩිවීම පිළිබිඹු කරමින්, කෘෂිකර්මයෙහි යෙදී සිටින කම්කරුවන්ගේ වැටුප් සියයට 9.3 කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, මෙය මූර්ත වැටුප් සියයට 5.9 ක අඩුවීමක් පෙන්නුම් කරයි. කර්මාන්ත සහ වාණිජ කටයුතුවල යෙදී සිටින කම්කරුවන්ගේ වැටුප් වර්ෂය තුලදී සියයට 4.8 කින් ඉහළ නැගුණි. පසුගිය වසරේ සැලකිය යුතු ලෙස වර්ධනය වී තිබුන මෙම කාණ්ඩයන්හි මූර්ත වැටුප්, 1996 දී සියයට 9.4 කින් පහත වැටුණි. 1996 දී සේවා අංශයේ සේවකයින්ගේ මූල්‍ය වැටුප් සියයට 6.7 කින් ඉහළ නැගුණි. මෙම කාණ්ඩයේ මූර්ත වැටුප් සියයට 7.8 කින් පහත වැටුණි.

## අසංවිධිත අංශය

අසංවිධිත අංශයේ දෛනික වැටුප් පිළිබඳ තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ දීප ව්‍යාප්ත දත්ත එකතු කිරීමේ වැඩපිළිවෙල මගින් රැස්කරනු ලැබේ. මෙම වැඩපිළිවෙල මගින් වී වගාව, සුළු ඉඩම්වල කෙරෙන තේ, රබර් සහ පොල් වගාවන් සහ සුළු පරිමාණ ඉදිකිරීම් කටයුතුවල ප්‍රධාන කාර්යයන්ට අදාළ දෛනික වැටුප් එකතු කරනු ලැබේ. උතුරු පළාත හැර දිවයින පුරා පැතිරුන මධ්‍යස්ථාන 100 කින් පමණ දත්ත රැස් කිරීම සිදු කෙරේ.

කුඩා පරිමාණ ඉදිකිරීම් කටයුතුවලට අදාල තාවකාලික දත්ත වලට අනුව, වඩු කාර්මිකයින්ගේ සහ මේසන්වරුන්ගේ වැටුප් සියයට 14 සිට සියයට 15 දක්වා වැඩි වූ අතර, එම කර්මාන්තයට අයත් නුපුහුණු අත් උදව්කරුවන්ගේ වැටුප් සියයට 13 කින් ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ගොඩනැගිලි කාර්යයන්හි මූර්ත වැටුප් පහත වැටුණි. තේ වගා අංශයේ ප්‍රධාන කටයුතුවල වැටුප් වැඩිවීම සියයට 9 ත්, 16 ත් අතර පරාසයක පැවති අතර, රබර් වගාවට අයත් ප්‍රධාන කාර්යයන්හි වැටුප් වැඩිවීම සියයට 7 ත්, 14ත් අතර පරාසයක පැවතුනි. පොල් වගාවට අයත් කාර්යයන්හි වැටුප් සියයට 8 ත්, 10 ත් අතර ප්‍රමාණයකින් ඉහළ නැගුණි. වී වගා අංශයේ බොහෝ කාර්යයන්හි මූල්‍ය වැටුප් වැඩිවීම සියයට 6 ත්, 13 ත් අතර පැවතුනි.